# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1313 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/08/2024<br>පැය 1645 |

## මාධ්‍ය නිවේදනය

**01. විදේශ රැකියා ලබා දෙන බවට පවසා මුදල් වංචා කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - බියගම පොලිස් වසම.**

2024.08.12 වන දින බියගම පොලිස් වසමේ බියගම නගරයේදී බියගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විදෙස් ගමන් බලපත්‍ර 32ක් හා විවිධ පොලිස් ස්ථාන වලින් නිකුත් කරන ලද පොලිස් වාර්තා 20 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 41 හා 46 වයස්වල පසුවන බියගම හා කොළඹගෙආර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් සිදුකල ප්‍රශ්න කිරීමේදී මොවුන් විදේශ රැකියා ලබා දෙන බවට පවසා මුදල් වංචා කර ඇති බවට අනාවරණය වී ඇති අතර මෙම වංචාවන්ට අදාල පැමිණිලි 06 ක් පමණ මේ වන විට පොලිස් ස්ථාන කිහිපයකට ලැබී ඇත. බියගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - වෙරළබඩ පොලිස් ස්ථානය.**

2024.08.12 වන දින උදෑසන කාලයේදී වෙරළබඩ පොලිස් වසමේ 131 වත්ත ප්‍රදේශයේදී වෙරළබඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන ජම්පටාවීදිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වෙරළබඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.08.12 වන දින දහවල් කාලයේදී හිරණ පොලිස් වසමේ මාලමුල්ල ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 14 මිලිග්‍රෑම් 100ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හිරණ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන පානදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හිරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**